**පරිගණක තාක්ෂණය**

# අන්තර්ජාලය ඔබටත්...

ඇමරිකානු ආරක්ෂක සේවාවන් හී ප්‍රයෝජනය තකා 1960 වසරේදී පමණ ආරම්භ වී 70 දශකයේදී වානිජ මට්ටමින් ලොව පුරා ව්‍යාප්තවූ අන්තර්ජාලය දැන් අපේ දෙසවනට සුපුරුදු වදනක් වී හමාර ය. අන්තර්ජාලය ශීඝ්‍රයෙන් ලොව පුරා ව්‍යාප්ත වීමට හේතු වූයේ ඕනෑ ම අයකුට පහසුවෙන් එය තුළට පිවිසීමටත්, එය තුළ හැසිරීමටත් ඇති නිදහස යි.

අප රටට අන්තර්ජාලය පිවිසියේ 1994 වර්ෂය තරම් මෑත කාලයේදී ය. එහි ගෞරවය හිමිවනුයේ 'ලංකා ඉන්ටර්නෙට් සර්විස්' ආයතනයට යි. ඉතා කෙටි කලකදී ලංකාව පුරා ව්‍යාප්ත වූ මෙම සේවාව, දැන් කාර්යාලයත් මෙන්ම නිවෙස් ද ආක්‍රමණය කර ඇත.



'සයිබර් කැෆේ'

උපදෙස්

**වසන්ත ද සිල්වා**

**අළෙවි කළමණාකරු**

**ලංකා ඉන්ටර්නෙට් සර්විස් ආයතනය**

මෙය කියවන ඔබ ද අන්තර්ජාලයේ සැරිසැරු අයකු විය හැකිය. නැතහොත් අන්තර්ජාලයේ සැරිසැරීමට ආශාවෙන් පසුවන්නකු විය හැකිය. කෙසේ වෙතත් අන්තර්ජාලයේ සැරිසැරීමට ප්‍රථම මූලිකවම සපුරාගත යුතු අවශ්‍යතා කීපයක් වේ. එනම්,

* පරිගණකයක්
* දත්ත හුවමාරුව සඳහා 'මෝඩමය' නමැති උපකරණයක්
* දූරකථන සම්බන්ධතාවක් යන කුරුණු යි.

මෙම අවශ්‍යතා සපුරා ගැනීමෙන් පසුව කළ යුත්තේ අන්තර්ජාල පහසුකම් ලබාදෙන ආයතනයකට ගොස් සරල අයදුම්පතක් පුරවා සම්බන්ධතාව ලබා ගැනීම යි. මෙහිදී ඔබට අවශ්‍ය නම් ඔබේ නිවසට ම පැමිණ සම්බන්ධතාව ලබා දීමට ඔවුන් කටයුතු කරන අතර යම් ගැටළු සහගත තත්ත්වයකදී පැය 24 පුරාම පවත්වන ක්ෂණික සේවාවක් ද ඔබ වෙනුවෙන් සපයයි.

මෙම සේවාවන් ලබා ගැනීමේදී යම් ගාස්තුවක් මාසිකව ගෙවීමට සිදුවේ. අන්තර්ජාල සේවාවන් සපයන ආයතනවල ගාස්තු විවිධාකාර වන අතර 'ලංකා ඉන්ටර්නෙට් සර්විස්' මගින් අය කරනු ලබන ගාස්තු රු. 250 සිට රු. 350, රු. 650 ආදී ලෙස විහිදී යයි. මෙහි දී රු. 350 වාරිකයකට පැය 12 ක ගවේෂණ කාලයක් ද රු. 650 වාරිකයකට පැය 30 ක පමණ ගවේෂණ කාලයක් ද හිමි වේ.



'ඉන්ටර්නෙට් බූත්'

මීට අමතරව අන්තර්ජාලයෙහි සැරිසරන කාලය වෙනුවෙන් දුරකථන සඳහා ද යම් මුදලක් වැයවෙන නිසා ඔබට අවශ්‍ය කුමන වාරිකය ද යන්න තීරණය කිරීම ඔබ සතු කාර්යයකි. මාසික වාරිකයක් නොගෙවා අන්තර්ජාලයෙහි සැරිසැරීමට ද ඔබට පුළුවන. මේ සඳහා විකල්ප කීපයක් ඇත. 'ඉන්ටර්නෙට් කාඩ්' සහ 'සයිබර් කැෆේ' භාවිත කිරීම ඉන් කීපයකි. මින් 'ඉන්ටර්නෙට් කාඩ්' භාවිත කිරීමේදී රු. 200, රු. 450, රු. 900 වැනි අගයන් ඇති කාඩ්පතක් මිලදී ගත යුතු වේ. මෙම කාඩ්පත් වෙනුවෙන් ම අලුතෙන් හඳුන්වාදී ඇති 'ඉන්ටර්නෙට් බූත්' (මෙම බූත්, දැනට දෙමටගොඩ, නුවර, ගල්කිස්ස, කොල්ලුපිටිය යන ස්ථානවල සවිකර ඇත) මගින් ද අන්තර්ජාලය පරිහරණය කිරීමට අවස්ථාව සැලසී ඇත. මීට අමතරව 'සයිබර් කැෆේ' වෙත ගොස් (පැය ගණනකට හෝ විනාඩි ගණනකට අය කරන) අන්තර්ජාලයේ සැරිසැරිය හැකිය.

අන්තර්ජාලයෙහි සැරිසැරීමේදී දුරකථන ගාස්තු සඳහා අධික මුදලක් වැය වන නිසා මෙයට පිවිසීමට ප්‍රථම වෙබ් අඩවියෙහි ලිපිනය දැන සිටීම ප්‍රයෝජනවත් වන අතර ලිපිනය නොදන්නෙහි නම් සෙවුම් යන්ත්‍රයක්(YAHOO) උපයෝගී කර ගැනීමෙන් කාලය ඉතුරු කර ගැනීමට පුළුවන. එමෙන් ම ඔබට අවශ්‍ය වැඩසටහන දෘඩ තැටියක ගබඩාකර තැබීමෙන් ද අන්තර්ජාල පිටුව Off Line මගින් පසුව නැරඹීම මගින් ද ඔබේ පසුම්බියට යම් සහනයක් ලැබේ.

අන්තර්ජාලය ව්‍යාප්ත කිරීමේදී අප රටට බලපාන බාධක අතර පරිගණක මිල, දුරකතන ගාස්තු ඉහළ මට්ටමක පැවතීම මෙන් ම ග්‍රාමීය පෙදෙස් කරා යාමේදී දුරකථන සම්බන්ධතා ලබා ගැනීමට ඇති අපහසුව ද බලපා ඇත. මෙම යටිතල පහසුකම් රජයේ මැදිහත් වීම මත සංවර්ධනය කළහොත් දැනට වඩා අන්තර්ජාලය ලංකාව තුළ ජනප්‍රිය කරවිය හැකිය.

අන්තර්ජාලයෙන් ඔබට සැලසෙන සේවාවන් ඉමහත් ය. එය තුළින් ඔබේ බුද්ධිය අලුත් කරන අතරතුර ම ආශ්වාදජනක ක්‍රීඩාවක නියැලීමට ද ඔබට හැකිය. එමෙන්ම ඔබව ආගාධයට ඇද දැමීමට ද එයට පුළුවන. එය ඔබේ බුද්ධිය මත රඳා පවතී. ❑

**- මොහාන්**